# ප්‍රසම්පාදන දැන්වීමයි

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යංශය

2025 වර්ෂය සඳහා කොළඹ 05 ඇසිදිසි මැදුර පරිශ්‍රයට ආරක්ෂක සේවා සැපයීමට මිල ගණන් කැඳවීම.

01. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යංශයේ කොළඹ 05 ඇසිදිසි මැදුර පිහිටි පරිශ්‍රයට ආරක්ෂක සේවා සැපයීම සඳහා ආරක්ෂක අමාත්‍යංශයේ ලියාපදිංචි වී ඇති ආයතන වලින් මිල ගණන් කැඳවනු ලැබේ.

02. මිල ගණන් ඉදිරිපත් කළ යුත්තේ අමාත්‍යංශය විසින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍ර වල පමණකි. ප්‍රසම්පාදන ලියවිලි ඉල්ලුම් කරන ආයතන 2025 වර්ෂය සඳහා ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යංශයේ ලියාපදිංචි වී ඇති සහ ආරක්ෂක කටයුතු සැපයීම පිළිබඳව අවම වශයෙන් අවුරුදු තුනක සතුටුදායක පළපුරුද්දක් ඇති ආයතන විය යුතු වේ. ආපසු නොගෙවනු ලබන රු. 1,000.00 ක ගාස්තුවක් අමාත්‍යංශයේ සරප් වෙත ගෙවා ලබා ගත් රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් පසු සාමාන්‍ය කාර්යාල දිනයන්හි දී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා . sණුම් අංශයෙන් ප්‍රසම්පාදන ලියවිලි ලබා ගත හැක.

03. ප්‍රසම්පාදන ලියවිලි 2025.03.11 වන දින ප.ව. 3.00 දක්වා නිකුත් කරනු ලැබේ.

04. නිසි පරිදි සකස් කරන ලද ප්‍රසම්පාදන ලියවිලි මුද්‍රා තබා 2025.03.12 වන දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ,

සභාපති
කණිෂ්ඨ ප්‍රසම්පාදන කමිටුව
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යංශය - ජනමාධ්‍ය අංශය
නො. 163, ඇසිදිසි මැදුර
කිරුළපන මාවත
පොල්හේන්ගොඩ
කොළඹ 05

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකිය. එසේ නැතිනම් අතින් රැගෙන විත් අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. නියමිත වේලාවට පසුව ලැබෙන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ලංසු බාර ගැනීම 2025.03.12 වන දින ප.ව. 2.00 ට අවසන් කරන අතර අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ඔබට හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

06. ප්‍රසම්පාදන ලියවිලි සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යංශයේ ජනමාධ්‍ය අංශයේ ගිණුම් අංශයේ දී නොමිලේ පරීක්ෂා කළ හැකිය.

07. වැඩි විස්තර සඳහා දුරකථන අංක 011-2513464 මගින් ප්‍රධාන ගණකාධිකාරී ඇමතීමෙන් ලබා ගත හැක.

සභාපති
කණිෂ්ඨ ප්‍රසම්පාදන කමිටුව
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යංශය - ජනමාධ්‍ය අංශය
කොළඹ 05